මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශය

# අනුරාධපුර හා පුත්තලම දිස්ත්‍රික්ක තුළ පාරිසරික සංවේදී කලාපයන්හි කෘෂිකාර්මික ජෛවවිවිධත්ව සංරක්ෂණය සඳහා ආදර්ශයන් අත්හදා බැලීම.

gef

පරිසර සංවේදී භූමි ප්‍රදේශවල ජෛව විවිධත්ව සංරක්ෂණය, ප්‍රවර්ධනය කිරීම හා පරිසර පද්ධති සේවා නඩත්තුව පිළිබඳ ව්‍යාපෘතිය.

UNDP
Empowered lives.
Resilient nations.

**තාක්ෂණික සහය:**

D.M.W දසානායක, උපදේශක, ESA ව්‍යාපෘතිය

**අනුග්‍රහය:**

පරිසර සංවේදී භූමි ප්‍රදේශවල ජෛව විවිධත්ව සංරක්ෂණය, ප්‍රවර්ධනය කිරීම හා පරිසර පද්ධති සේවා නඩත්තුව පිළිබඳ GEF/UNDP ව්‍යාපෘතිය.

"පාරිසරික සංවේදී ප්‍රදේශ වල ජෛව විවිධත්ව සංරක්ෂණය සහ පරිසර පද්ධති සේවා නඩත්තුව" යනු ගෝලීය පාරිසරික පහසුව (GEF) විසින් අරමුදල් සපයනු ලබනල එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහනේ සහයෝගයෙන් මහවැලි සංවර්ධන සහ පාරිසරික අමාත්‍යාංශය විසින් ක්‍රියාත්මක කරනු ලබන ව්‍යාපෘතියකි. ශ්‍රී ලංකාව තුළ සංරක්ෂණ වටිනාකමක් සහිත ප්‍රදේශ සංවර්ධනය කිරීමේදී ජෛව විවිධත්ව සංරක්ෂණ මූලධර්මයන්ට අනුගත භූමිපරිහරණ සැළසුම් ක්‍රියාත්මක කිරීමේ ප්‍රවේශයන් අත්හදා බැලීම මෙහි අරමුණයි.

## සංකේත නාම

ESA - පරිසර සංවේදී ප්‍රදේශ

DS - ප්‍රාදේශීය ලේකම් කාර්යාලය

GAP - යහපත් කෘෂිකාර්මික භාවිතයන්

G.C.E - අධ්‍යාපන පොදු සහතික පත්‍ර විභාගය

PDOA - පළාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුව

DOA - කෘෂිකර්ම දෙපාර්තමේන්තුව

IPNS - ඒකාබද්ධ කල ශාක පෝෂණ පද්ධතිය

IPM - ඒකාබද්ධ පලිබෝධ කළමනාකරණය

OFC - වෙනත් ක්ෂත්‍ර බෝග

**1 වන පරිච්ඡේදය** ......... 1

කෘෂි පරිසර පද්ධති තුළ දිරිගැන්වීම් පාදක කරගත් ජෛව විවිධත්වය ප්‍රධාන ප්‍රවාහයට ගැනීම යටතේ ආදර්ශ අත්හදා බැලීම ......... 1

1.1 පසුබිම ......... 1

1.2 දිරිගැන්වීම් පාදක කරගත් ආදර්ශ අත්හදා බැලීමේ අවශ්‍යතාව ......... 1

1.3 ආදර්ශ නිර්මාණය කිරීමේදී සළකා බලන ප්‍රධාන සාධක ......... 2

1.4 ව්‍යාපෘති පිහිටීම්වල කෘෂි පාරිසරික කලාප සහ ඒවායේ ලක්ෂණ ......... 2

1.4.1 කෘෂිකාර්මික කන්නයන් ......... 3

1.4.2 ව්‍යාපෘති ප්‍රදේශයෙහි වර්ෂාපතන රටාව ......... 3

1.5 දිස්ත්‍රික්ක දෙකෙහි වර්තමාන කෘෂිකාර්මික භාවිතයන් - ......... 3

1.6 ව්‍යාපෘති ස්ථානවල සමාජ ආර්ථික දත්ත ......... 3

1.6.1 පුත්තලම සහ අනුරාධපුර දිස්ත්‍රික්ක තුළ තෝරාගත් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ තුළ සාක්ෂරතා අනුපාත ......... 3

1.6.2 ස්ත්‍රී පුරුෂ සමාජ භාවය සහ වයස ......... 4

1.6.3 කෘෂිකර්මයෙහි නියැලී සිටින පිරිමි සහ කාන්තා ගොවීන්ගේ ප්‍රතිශතයන් සහ ඔවුන්ගේ සාක්ෂරතා අනුපාත ......... 5

**2 වන පරිච්ඡේදය** ......... 5

2.1 අනුගමනය කරන ක්‍රමවේදය ......... 5

2.2 ආදර්ශ සංවර්ධන ක්‍රියාවලිය ......... 5

2.2.1 ප්‍රතිලාභීන් තෝරාගැනීම ......... 5

2.2.2 සළකා බලන ලද සාමාන්‍ය නීතිරීති ......... 6

2.2.3 දළ ආන්තිකයන් මත පදනම් වූ මූල්‍ය දර්ශක ......... 6

**3 වන පරිච්ඡේදය** ......... 6

1 වන ආදර්ශය ......... 6

ජෛව විවිධත්වය සංරක්ෂණය කිරීමට ගෙවතු වගා සංවර්ධනය (අක්කර 0.5) ......... 6

3.1.1 ආදර්ශයේ යෝජිත ප්‍රමාණය - අක්කර 0.5- ......... 6

3.1.2 ශ්‍රම අවශ්‍යතාවය ......... 6

3.1.3 බෝග සංයෝජන, පරතරය, ප්‍රභේද සහ ශාක සංඛ්‍යාව ......... 7

3.1.4 ආදර්ශයේ විවිධ අංශ සහ ක්ෂේත්‍ර සැළැස්ම ......... 7

3.1.5 මෙම ආදර්ශය සඳහා සැළකිල්ලට ගත් උපකල්පන සහ සාධක ......... 12

3.1.6 වන ආදර්ශය සඳහා ඇස්තමේන්තුව ......... 13

3.1.7 ලබාගත හැකි ආදායම ......... 14

3.1.8 දළ ආන්තිකයන් මත පදනම් වූ මූල්‍යමය නිර්ණායක - වසර 10 කට ......... 15

2 වනි ආදර්ශය ..........16
වැඩිදියුණු කළ ජෛව විවිධත්ව සංරක්ෂණය සහ යහපත් කෘෂිකාර්මික භාවිතයන් සමග අඹ වගා කිරීම (අක්කර 1) ..........16
3.2.1 ආදර්ශයේ යෝජිත ප්‍රමාණය - අක්කර 1 ..........16
3.2.2 ශ්‍රම අවශ්‍යතාවය - පවුලේ සහ කුලියට ගත් ශ්‍රමය. ..........16
3.2.3 බෝග සංයෝජනය, පරතරය, ප්‍රභේද සහ පැළ සංඛ්‍යාව ..........16
3.2.4 ආදර්ශයේ විවිධ අංග සහ ක්ෂේත්‍ර සැළැස්ම ..........16
3.2.5 මෙම ආදර්ශය සඳහා සැළකිල්ලට ගත් උපකල්පන සහ සාධක ..........21
3.2.6 2 වැනි ආදර්ශය සඳහා ඇස්තමේන්තුව ..........22
3.2.7 ලබාගත හැකි ආදායම ..........23
3.2.8 දළ ආන්තිකයන් මත පදනම් වූ මූල්‍යමය නිර්ණායක ..........24

3 වන ආදර්ශය ..........25
ගොවිපළ සංවර්ධනය - වැසි ජලය රැස්කිරීම සහ භාවිතය - අක්කර 1 ..........25
3.3.1 ආදර්ශයෙහි යෝජිත ප්‍රමාණය -අක්කර 1- ..........25
3.3.2 ශ්‍රම අවශ්‍යතාවය - පවුලේ සහ කුලියට ගත් ශ්‍රමය. ..........25
3.3.3 බෝග, පරතරය, ප්‍රභේද සහ පැළ සංඛ්‍යාව ..........25
3.3.4 ආදර්ශයේ විවිධ අංග සහ ක්ෂේත්‍ර සැළැස්ම ..........25
3.3.5 3 වැනි ආදර්ශය සඳහා ඇස්තමේන්තුව ..........31
3.3.6 3 වැනි ආදර්ශය සඳහා ආදායම් පුරෝකථනය ..........32
3.3.7 දළ ආන්තිකයන් මත පදනම් වූ මූල්‍ය නිර්ණායක ..........33

4 වැනි ආදර්ශය ..........34
හේන් ස්ථාවර කිරීම (අක්කර 1) ..........34
3.4.1 ආදර්ශයේ යෝජිත ප්‍රමාණය - අක්කර 1 ..........34
3.4.2 ශ්‍රම අවශ්‍යතාව ..........34
3.4.3 බෝග සංයෝජන ..........34
3.4.4 ආදර්ශයේ විවිධ අංගයන් සහ ක්ෂේත්‍ර සැළැස්ම ..........35
3.4.5 4 වැනි ආදර්ශය සඳහා ඇස්තමේන්තුව ..........38
3.4.6 ලැබිය හැකි ආදායම ..........39
3.4.7 දළ ආන්තිකයන් මත පදනම් වූ මූල්‍ය නිර්ණායක ..........40

5 වැනි ආදර්ශය ....... 41
මහවැලි කුඹුරු ඉඩම් සංවර්ධනය ....... 41
3.5.1 ආදර්ශයේ යෝජිත ප්‍රමාණය - අක්කර 2.5 ....... 41
3.5.2 ශ්‍රම අවශ්‍යතාවය - මෙම ආදර්භයට කුලියට ගත් ශ්‍රමය භාවිතා කළ යුතුව ඇත. ....... 41
3.5.3 බෝග සංයෝජනය, පරතර තැබීම, ප්‍රභේදයන් සහ පැල සංඛ්‍යාව ....... 41
3.5.4 ආදර්ශයේ විවිධ අංග සහ ක්ෂේත්‍ර සැළැස්ම ....... 42
3.5.5 5 වැනි ආදර්ශය සඳහා ඇස්තමේන්තුව ....... 43
3.5.6 ලබාගත හැකි ආදායම - 5 වැනි ආදර්ශය ....... 43
3.5.7 දළ ආන්තිකයන් මත පදනම් වූ මූල්‍යමය නිර්ණායක ....... 44

6 වැනි ආදර්ශය ....... 46
පාරිසරික උවදුරු අවම කිරීම සඳහා කෘෂි රසායන ආරක්ෂාකාරී ලෙස භාවිතා කිරීම ....... 46
3.6.1 අරමුණු ....... 46
3.6.2 ක්‍රියාකාරකම්. . ....... 46
3.6.3 සපයනු ලබන ද්‍රව්‍ය ....... 46
3.6.4 6 වන ආදර්ශය සඳහා ඇස්තමේන්තුව ....... 47

**4 වන පරිච්ඡේදය** ....... 47
4.1 ආදර්ශ වර්ග වල සාරාංශය, පළාත් දෙපාර්තමේන්තු දෙක වෙතින් යෝජනා කර ඇති ප්‍රතිවලිත කිරීම් සංඛ්‍යාව ....... 47
4.2 පළාත් දෙපාර්තමේන්තු දෙකට අනුමත කළ ආදර්ශ සහ ප්‍රතිවලිත කිරීම් සංඛ්‍යාව ....... 48

**5 වැනි පරිච්ඡේදය** ....... 49
5.1 ක්ෂේත්‍රයේ පිහිටුවීම සහ අධීක්ෂණ ක්‍රියාවලිය ....... 49

# 1 වන පරිච්ඡේදය

## කෘෂි පරිසර පද්ධති තුළ දිරිගැන්වීම් පාදක කරගත් ජෛව විවිධත්වය ප්‍රධාන ප්‍රවාහයට ගැනීම යටතේ ආදර්ශ අත්හදා බැලීම

### 1.1 පසුබිම

කෘෂිකර්මය තුළ ජෛව විවිධත්වය යනු ආහාර සඳහා වේගයෙන් වර්ධනය වන ඉල්ලුම සපුරාලන අතරම, ඉඩම්, බෝග, සහ සතුන් ආරක්ෂා කිරීම සහ එය වඩාත් තිරසාර අන්දමින් ඉටුකිරීමය. අනුරාධපුරය සහ පුත්තලම යන දිස්ත්‍රික්ක දෙකෙහිම ප්‍රමාණය ඉක්මවා ගිය පළිබෝධනාශක සහ රසායනික පොහොර භාවිතය උග්‍ර ගැටළුවක් වී ඇත. හේන් ගොවිතැන සඳහා කෙරෙන වන විනාශය සහ සමුද්‍ර සම්පත් විනාශය නොනවත්වා කෙරෙන අතර, මෙය පාලනය කර ජෛව විවිධත්වයට වඩාත් හිතකර භාවිතයන් හඳුන්වාදීමේ අවශ්‍යතාවක් පවතී. පුත්තලම දිස්ත්‍රික්කය තුළ ප්‍රමාණය ඉක්මවූ පොහොර සහ කෘෂි රසායන නිසා දැනටමත් භූගත ජලය දූෂණයට ලක්ව, මිනිසුන්ට සහ සතුන්ට ප්‍රබල තර්ජනයකට හේතුවී ඇත. කඩොලාන විනාශය ද ඉස්සන්ට තර්ජනයක් වී ඇත්තේ, කඩොලාන ඉස්සන්ගේ අභිජනන භූමිය වන නිසාය.

අන්තර් ආංශික සැළසුම් සංවර්ධනයට ජෛව විවිධත්වය ඒකාබද්ධ කිරීම සහ කෘෂිකර්මය, ධීවර කර්මාන්තය සහ ගෙවතු කළමනාකරණයට, දිරිගැන්වීම් පාදක කරගත් ප්‍රධාන ප්‍රවාහ ගතකළ ජෛව විවිධත්ව සංරක්ෂණය ක්‍රියාත්මක කිරීම ඉතා වැදගත් සහ කාලීන මැදහත්වීමක් ලෙස පෙනී යයි.

කෘෂි පරිසර පද්ධතිය තුළ විවිධ බෝග වර්ග පවතින අතර, මෙම බෝග වලින් බොහොමයක් නිවසේ පරිභෝජනය හෝ ආදායම් උත්පාදනය සඳහා අතිශයින් වැදගත් වේ. කුඹුරු ඉඩම්, පළතුරු වගාවන්, කුඩා පරිමාණ බෝග ඉඩම් හෝ වෙනත් ක්ෂේත්‍ර වගා (මාංශ බෝග, තල ආදිය), එළවළු වගාවන්, බෝග වගා (ප්‍රධාන අපනයන බෝග), කුඩා අපනයන බෝග, ගෙවතුවල පළතුරු වගා ඇතුළුව ගෙවතු වගා, හේන් ගොවිතැන් යන මේවා මෙම දිස්ත්‍රික්ක දෙකෙහි වගාකරන ප්‍රධාන වගාවන් වන අතර, කෘෂිකර්මය සඳහා ජෛව විවිධත්ව වැඩසටහන් නිර්මාණය කිරීමේදී මෙම බෝග අමතක කළ නොහැක. මෙම දිස්ත්‍රික්ක දෙක තුළ යම් නවෝත්පාදන හඳුන්වාදීම හරහා කෘෂිකර්ම අංශයේ ජෛව විවිධත්ව සංරක්ෂණය වැඩිදියුණු කිරීමට අපේක්ෂා කෙරේ. ජාතික තලයට නිර්දේශ කිරීමට පෙර ගොවීන්ගේ වගා බිම්වල අත්හදා බැලීම සඳහා කෘෂිකර්මයට සම්බන්ධ නව ආදර්ශ සංවර්ධනය කිරීම මෙම ව්‍යාපෘතියෙහි ප්‍රධාන යෝජනාවකි.

### 1.2 දිරිගැන්වීම් පාදක කරගත් ආදර්ශ සංවර්ධනය කිරීමේ අවශ්‍යතාව

ව්‍යාපෘති ක්‍රියාකාරකම් කලාඔය කලාපය තුළ සිදුකෙරෙන අතර, කලාඔය ගංගා ද්‍රෝණිය සහ කලාඔය කලාපය තුළ ඒ වටා ඇති පෙදෙස් ඇතුළත් වේ; යෝජිත පරිසර සංවේදී පෙදෙස් ලෙස පිහිටීම් දෙකක් හඳුනාගෙන ඇත. ප්‍රථම පිහිටීම - කලාවැව, ගංගා ද්‍රෝණියෙහි ඉහළ වක්කලමට වැටෙන අතර, කලාවැව නමින් හැඳින්වෙන විශාල ජලාශයක් ආවරණය කරයි. දෙවන පිහිටීම - එනම් විල්පත්තුව, ද්‍රෝණියේ පහළ කොටසේ පිහිටා ඇති අතර, බාර් රීෆ් ඇතුළු මුහුදු ප්‍රදේශයද, කලාඔයෙහි කලපුව ද, ආවරණය කරයි. කෘෂිකාර්මික ජෛව විවිධත්ව සංරක්ෂණ ක්‍රියාකාරකම් පුත්තලම දිස්ත්‍රික්කය තුළ වනාතවිල්ලුව සහ කරුවලගස්වැව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශවල සිදු කෙරෙන අතර, අනුරාධුපර දිස්ත්‍රික්කයේ මෙම ක්‍රියාකාරකම් පලාගල, කැකිරාව, ගල්නෑව සහ ඉපලෝගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශවල සිදු කෙරෙනු ඇත.

වර්තමාන කෘෂිකාර්මික භාවිතයන් යටතේ කෘෂි ජෛව විවිධත්වය ආරක්ෂා කිරීමට වැඩි අවධානයක් යොමුකර නොමැත. රසායනික පොහොර සහ පළිබෝධනාශකවල වැරදි භාවිතය සහ අධික මාත්‍රා යෙදීමෙහි ප්‍රතිඵලය ලෙස භූගත ජලයෙහි ගුණාත්මකභාවය ගැන බරපතළ ගැටළු මතුවී මෙම පෙදෙස්වල මිනිසුන්ට සහ සතුන්ට බොහෝ සෞඛ්‍ය උවදුරුවලට මඟ පාදා ඇත. අනෙක් අතට, දේශගුණික විපර්යාස සහ ජල හිඟය ඔවුන්ගේ ආදායම් ප්‍රභවයන් සීමා කර ඇත. වියළි කලාපයේ ගොවීන් හට ඔවුන්ගේම විශාල ඉඩම් ප්‍රමාණයන් තිබුණත්, මෙම දේශගුණික ගැටළු හේතුවෙන් ඔවුන්ගේ ඉඩම් වලින් ප්‍රශස්ත ඵල ලබා ගැනීමට නොහැකි වී ඇත. මෙම ව්‍යාපෘතියෙහි ප්‍රධාන යොමුව වන්නේ, දිස්ත්‍රික්ක දෙකෙහි හේන් ගොවිතැනට සහ ගෙවතුවලට ජෛව විවිධත්වය ඒකාබද්ධ කිරීම සහතික කිරීමයි. මෙම අරමුණු ඉටුකර ගැනීම පිණිස යම් ප්‍රායෝගික, ඵලදායී, සමාජයීයව පිළිගත හැකි සහ ආර්ථික වශයෙන් ඵලදායී නව කෘෂිකාර්මික ආදර්ශ ඉහත සඳහන් පෙදෙස්වල අත්හදා බැලීමට යෝජනා කෙරේ. පවතින දේශගුණය, ඉඩම් භාවිතය සහ ප්‍රදේශයේ බෝග වගා කිරීමේ රටාවන් සහ කෘෂිකර්ම දෙපාර්තමේන්තු නිලධාරීන්ගේ පවතින දැනුම මෙන්ම අත්දැකීම් යන ප්‍රධාන සාධක සැළකිල්ලට ගෙන මෙම ආදර්ශ සංවර්ධනය කරනු ඇත.

### 1.3 ආදර්ශ නිර්මාණය කිරීමේදී සළකා බලන ප්‍රධාන සාධක

1. ජීවනෝපායය ක්‍රියාකාරකම් වැඩිදියුණු කිරීම සහ ජෛව විවිධත්වය සංරක්ෂණයට වැඩි අවධානයක් යොමු කරනු ඇත.
2. ආහාර සුරක්ෂිතතාව
3. තිරසාර සහ නිත්‍ය අදායම් මූලාශ්‍රයන්
4. බෝග වගා රටාවන් තුළට ඌන උපයෝගිතා බෝග වර්ග අන්තර්ගත කිරීම සහ යහපත් කෘෂිකාර්මික භාවිතයන් (GAP) ලේබල් සහිතව ගොවීන්ගේ වෙළඳපොලට නිෂ්පාදන සම්බන්ධ කිරීම.
5. ජල සුරැකුම් ක්‍රම
6. ඒකාබද්ධ පළිබෝධ පාලනය සහ යහපත් කෘෂිකාර්මික භාවිතයන් හි (GAP) ක්‍රම ඇතුළත් කිරීම.
7. පොහොර සහ පළිබෝධනාශක භාවිතයේදී නිර්දේශ කර ඇති මට්ටම් පමණක් භාවිතා කිරීමට ගොවීන්ට අනුබල දීම.
8. පවතින බෝග වගා රටාවන්, වර්ෂාපතනය සහ පස් වර්ග සහ සාම්ප්‍රදායික වගා ක්‍රම අධ්‍යයනය කිරීම.
9. ආදර්ශ සංවර්ධන ක්‍රියාවලියේදී දෙපාර්තමේන්තු නිලධාරීන්ගේ අත්දැකීම් සහ දැනුම භාවිතා කිරීම.

### 1.4 ව්‍යාපෘති පිහිටීම්වල කෘෂි පාරිසරික කලාප සහ ඒවායේ ලක්ෂණ

| දිස්ත්‍රික්කය | ප්‍රා.ලේ. කොට්ඨාශය | කෘෂි පාරිසරික කලාපය | ලක්ෂණ |
|---|---|---|---|
| **පුත්තලම** | **කරුවලගස්වැව** | **DL1b සහ DL1f** | DL1b ප්‍රධාන පස් කාණ්ඩය වන රතු පැහැති දුඹුරු පසින් සමන්විතය. මෙම ප්‍රදේශයට යල කන්නයේදී අඩු වර්ෂාපතනයක් ලැබෙන අතර, මැයි මස දෙවන සතියේ සිට සැප්තැම්බර් දක්වා වියළි ව පවතී. DL1f ප්‍රදේශයෙහි මහ කන්නය තුළ වර්ෂාපතනය ඉතා අඩු මට්ටමක පවතින අතර වැසි පෝෂිත වගාව ද බෙහෙවින් අවිනිශ්චිතය. |
| | **වනාතවිල්ලුව** | **DL3** | ප්‍රදේශයෙහි ප්‍රධාන පස් වර්ගය රතු කහ පැහැති ලැටසෝල් වන නමුත්, වෙරළ/වෙරළාසන්න ව රිගාසෝල් දැකිය හැක. මෙම පස ස්වභාවයෙන් සිදුරු සහිතය. එමෙන්ම ඇතුළත ඇති හුණුගල් ස්ථරය නිසා පසෙහි ජලය රඳවා තබා ගැනීම සහ ජලය ලබාගැනීමේ හැකියාව ඉතා ඉහළය. මෙම ප්‍රදේශයට හොඳ වර්ෂාපතනයක් ඔක්තෝම්බර් සිට දෙසැම්බර් දක්වා ලැබෙන බැවින් පවතින්නේ ඉතා කෙටි මහ කන්නයකි. දෙසැම්බරයට පසු වියළි කාලගුණයක් පවතී. වාරි ජල සම්පාදනය යටතේ වගාව සඳහා මෙම පස ඉතා සුදුසුය. |
| **අනුරාධපුර** | **පලාගල, ගල්නෑව, කැකිරාව සහ ඉපලෝගම** | **DL1b** | මෙම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ සතරම රතු පැහැති දුඹුරු පසින් සමන්විත වන අතර, යල කන්නය තුළදී ලැබෙන්නේ ඉතා අඩු වර්ෂාපතනයකි. මැයි මස දෙවැනි සතියේ සිට සැප්තැම්බර් අග දක්වා වියළි කාලගුණයක් පවතී. |

### 1.4.1 කෘෂිකාර්මික කන්නයන්

ඉහත සඳහන් කළ පරිදි, ශ්‍රී ලංකාව වර්ෂාපතන කාල සතරකින් වර්ෂාව ලබයි. එනම්, පළමු අන්තර් මෝසම්, නිරිතදිග මෝසම්, දෙවන අන්තර් මෝසම් සහ ඊශානදිග මෝසම් යනුවෙනි. කෘෂිකාර්මික ක්‍රියාකාරකම් සඳහා, මෙම කාලයන් සතර, කන්න දෙකකට සම්බන්ධ කළ හැක. එනම්, යල සහ මහ යනුවෙනි. යල කන්නය මාර්තු සිට සැප්තැම්බර් දක්වා වන අතර, පළමු අන්තර්-මෝසම සහ නිරිත දිග මෝසම එයට ඇතුළත් වේ. මහ කන්නය ඔක්තෝම්බර් සිට පෙබරවාරි දක්වා අර්ථ දක්වා ඇති අතර, එයට දෙවැනි අන්තර්-මෝසම සහ ඊශානදිග මෝසම ඇතුළත් වේ.

### 1.4.2 ව්‍යාපෘති ප්‍රදේශයෙහි වර්ෂාපතන රටාව

අන්තර් මෝසම්, නිරිතදිග සහ ඊශානදිග මෝසම් රටට වැසි ලබා දෙයි.

1-පළමු අන්තර් මෝසම මාර්තු සිට අප්‍රේල් දක්වා වේ.

2-නිරිතදිග මෝසම මැයි - සැප්තැම්බර් වේ.

3-දෙවන අන්තර් මෝසම ඔක්තෝම්බර් - නොවැම්බර් වේ.

4-ඊශානදිග මෝසම දෙසැම්බර් - පෙබරවාරි දක්වා වේ.

මෙම දිස්ත්‍රික්ක දෙකටම ඊශානදිග මෝසම් වලින් සැළකිය යුතු වර්ෂාපතනයක් ලැබෙන නමුත්, නිරිතදිග මෝසම් වලින් එසේ නොවේ. මෙම හේතුව නිසා, අතිරේක වාරි ජලය නොතිබුණහොත්, යල කන්නයේ වගාව සමහර බෝගවලට පමණක් සීමා වේ. යල කන්නය තුළ, සාමාන්‍යයෙන් මැයි දෙවන සතියේ සිට සැප්තැම්බර් අග දක්වා වියළි කාලගුණයක් බලාපොරොත්තු විය හැක. ආදර්ශ නිර්මාණය කිරීමේදී මෙම වැදගත් සාධකය සැළකිල්ලට ගත් අතර, ඒ අනුව සමහර තාක්ෂණික ක්‍රම අනුගමනය කරනු ඇත.

## 1.5 දිස්ත්‍රික්ක දෙකෙහි වර්තමාන කෘෂිකාර්මික භාවිතයන්

වනාතවිල්ලුව, කැකිරාව, පලාගල, ඉපලෝගම සහ ගල්නෑව සඳහා යල සහ මහ කන්න වලට නිර්දේශිත බෝග සහ බෝග දින දර්ශනය ඇමුණුම 1 හි දක්වා ඇත.

ප්‍රවේශමෙන් සැළසුම් කළහොත්, කන්න දෙක තුළ විවිධ පරාසයක බෝග වගා කළ හැකි බව පැහැදිලිය.

## 1.6 ව්‍යාපෘති ස්ථානවල සමාජආර්ථික දත්ත

### 1.6.1 පුත්තලම සහ අනුරාධපුර දිස්ත්‍රික්ක තුළ තෝරාගත් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ තුළ සාක්ෂරතා අනුපාත

| ස්ත්‍රී පුරුෂ සමාජ භාවයට අනුව පුත්තලම දිස්ත්‍රික්කයේ ප්‍රා. ලේ. කොට්ඨාශ දෙකක ගොවීන්ගේ සාක්ෂරතා අනුපාත | | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| ප්‍රා. ලේ. කොට්ඨාශය | පාසැල් නොගිය | | 5 ශ්‍රේණිය තෙක් පාසැල් ගිය | | 6-10 ශ්‍රේණි දක්වා පාසැල් ගිය | | අ.පො.ස. (සා. පෙළ) | | අ.පො.ස. (උ. පෙළ) | | උපාධිය හෝ ඉහළ | | මුළු සංඛ්‍යාව | |
| | පි | ගැ | පි | ගැ | පි | ගැ | පි | ගැ | පි | ගැ | පි | ගැ | පි | ගැ |
| වනාතවිල්ලුව | 90 | 31 | 648 | 224 | 1123 | 212 | 335 | 50 | 125 | 22 | 20 | 4 | 2341 | 543 |
| කරුවලගස්වැව | 187 | 88 | 1549 | 571 | 2689 | 581 | 698 | 144 | 256 | 48 | 60 | 8 | 5349 | 1440 |

මූලාශ්‍රය - 2014 ආර්ථික සංගණනය - සංගණන සහ සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව

වනාතවිල්ලුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයෙහි පිරිමින්ගෙන් 75% ක් පාසැල් ගොස් ඇත්තේ 10 වන ශ්‍රේණිය දක්වා පමණක් වන අතර, එහි කාන්තා ප්‍රතිශතය 80% ක් වේ. කරුවලගස්වැව තුළ මෙම ප්‍රතිශතයන් පිරිමින් සහ කාන්තාවන් සඳහා, පිළිවෙලින් 79% සහ 80% ක් වේ.

| ස්ත්‍රී පුරුෂ සමාජ භාවයට අනුව අනුරාධපුර දිස්ත්‍රික්කයේ ප්‍රා. ලේ. කොට්ඨාශ දෙකක ගොවීන්ගේ සාක්ෂරතා අනුපාත | | | | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| **ප්‍රා. ලේ. කොට්ඨාශය** | **පාසැල් නොගිය** | | **5 ශ්‍රේණිය තෙක් පාසැල් ගිය** | | **6 -10 ශ්‍රේණි දක්වා පාසැල් ගිය** | | **අ.පො.ස. (සා. පෙළ)** | | **අ.පො.ස. (උ. පෙළ)** | | **උපාධිය හෝ ඉහළ** | | **මුළු සංඛ්‍යාව** | | | |
| | පි | ගැ | පි | ගැ | පි | ගැ | පි | ගැ | පි | ගැ | පි | ගැ | පි | ගැ | | |
| **කැකිරාව** | 160 | 110 | 1726 | 497 | 4632 | 825 | 1850 | 317 | 897 | 158 | 251 | 35 | 9516 | 1942 | | |
| **ඉපලෝගම** | 148 | 83 | 1288 | 363 | 2493 | 469 | 1423 | 219 | 738 | 152 | 186 | 27 | 6276 | 1313 | | |
| **ගල්නෑව** | 120 | 56 | 1728 | 433 | 3152 | 462 | 1295 | 235 | 532 | 97 | 113 | 17 | 6940 | 1300 | | |
| **පලාගල** | 202 | 88 | 1765 | 431 | 2963 | 449 | 1519 | 258 | 681 | 106 | 119 | 18 | 7249 | 1350 | | |

මූලාශ්‍රය - 2014 ආර්ථික සංගණනය - සංගණන සහ සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව

## 1.6.2 ස්ත්‍රී පුරුෂ සමාජ භාවය සහ වයස

| පුත්තලම දිස්ත්‍රික්කය තුළ ප්‍රා.ලේ. කොට්ඨාශ දෙකක ස්ත්‍රී පුරුෂ සමාජභාවය සහ වයස අනුව ගොවීන්ගේ ව්‍යාප්තිය | | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| **ප්‍රා. ලේ. කොට්ඨාශය** | **වයස් කණ්ඩායම අවුරුදු** 10 - 19 | | **අවුරුදු** 20 - 29 | | **අවුරුදු** 30 - 39 | | **අවුරුදු** 40 - 49 | | **අවුරුදු** 50 - 59 | | **අවුරුදු** 60 **සහ ඊට වැඩි** | | **මුළු සංඛ්‍යාව** | |
| | පි | ගැ | පි | ගැ | පි | ගැ | පි | ගැ | පි | ගැ | පි | ගැ | පි | ගැ |
| වනාතවිල්ලු ව | **1** | **2** | **191** | **21** | **636** | **123** | **616** | **130** | **464** | **125** | **433** | **142** | **2341** | **543** |
| කරුවලගස් වැව | **6** | **1** | **469** | **76** | **1491** | **237** | **1378** | **303** | **1161** | **388** | **934** | **435** | **5439** | **1440** |

*මූලාශ්‍රය - 2014 ආර්ථික සංගණනය - සංගණන සහ සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව*

වනාතවිල්ලුවෙහි කෘෂිකාර්මික ක්‍රියාකාරකම්වල යෙදෙන පිරිමින්ගෙන් 91% ක් වයස අවුරුදු 30 ත් 60 ත් අතර වන අතර, කාන්තාවන්ගෙන් එය 99% ක් පමණ වේ. කරුවලගස්වැව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය තුළ ද මෙම ප්‍රතිශතයන් 91% සහ 94% ක් වේ. මෙයින් පෙනෙන්නේ වඩා තරුණ පරම්පරාව කෘෂිකාර්මික ක්‍රියාකාරකම්වල නියැලීමට අකැමති බවයි. කෘෂිකර්මයෙහි තරුණ නියැලීම ඉතා සීමිත බවක් පෙනේ.

| අනුරාධපුර දිස්ත්‍රික්කය තුළ ප්‍රා.ලේ. කොට්ඨාශ සතරක ස්ත්‍රී පුරුෂ සමාජභාවය සහ වයස අනුව ගොවීන්ගේ ව්‍යාප්තිය | | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| ප්‍රා. ලේ. කොට්ඨාශය | **වයස් කණ්ඩායම අවුරුදු** 10 - 19 | | **අවුරුදු** 20 - 29 | | **අවුරුදු** 30 - 39 | | **අවුරුදු** 40 - 49 | | **අවුරුදු** 50 - 59 | | **අවුරුදු** 60 **සහ ඊට වැඩි** | | **මුළු සංඛ්‍යාව** | |
| | පි | ගැ | පි | ගැ | පි | ගැ | පි | ගැ | පි | ගැ | පි | ගැ | පි | ගැ |
| **කැකිරාව** | **5** | **1** | **400** | **62** | **2152** | **238** | **2543** | **389** | **2417** | **561** | **1999** | **691** | **9516** | **1942** |
| **ඉපලෝගම** | **4** | **1** | **261** | **37** | **1373** | **176** | **1808** | **283** | **1553** | **411** | **1277** | **405** | **6276** | **1313** |
| **ගල්නෑව** | **3** | **-** | **281** | **62** | **1675** | **204** | **1925** | **296** | **1699** | **378** | **1357** | **360** | **6940** | **1300** |
| **පලාගල** | **6** | **1** | **390** | **47** | **1621** | **181** | **1969** | **289** | **1775** | **387** | **1488** | **445** | **7249** | **1350** |
| | | | | | | | | | | | | | | |

*මූලාශ්‍රය - 2014 ආර්ථික සංගණනය - සංගණන සහ සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව*

### 1.6.3 කෘෂිකර්මයෙහි නියැලී සිටින පිරිමි සහ කාන්තා ගොවීන්ගේ ප්‍රතිශතයන් සහ ඔවුන්ගේ සාක්ෂරතා අනුපාත

| ප්‍රා. ලේ. කොට්ඨාශය | 10 ශ්‍රේණිය දක්වා පාසැල් ගොස් ඇති පිරිමි සංඛ්‍යාව | % | 10 වන ශ්‍රේණිය දක්වා පාසැල් ගොස් ඇති කාන්තාවන් සංඛ්‍යාව | % | කෘෂිකර්මයේ නියැලෙන අවුරුදු 30 - 64+ වයස් කාණ්ඩයෙහි පිරිමි සංඛ්‍යාව | % | කෘෂිකර්මයෙහි නියැලෙන අවුරුදු 30 - 60+ වයස් කාණ්ඩයෙහි කාන්තාවන් සංඛ්‍යාව | % |
|---|---|---|---|---|---|---|---|---|
| කැකිරාව | 6358 | 66.81 | 1322 | 68.07 | 9111 | 95.74 | 1879 | 96.75 |
| ඉපලෝගම | 3781 | 60.24 | 832 | 63.36 | 6011 | 95.77 | 1275 | 97.10 |
| ගල්නෑව | 4880 | 70.31 | 895 | 68.84 | 6656 | 95.90 | 1238 | 95.23 |
| පලාගල | 4728 | 65.22 | 880 | 65.18 | 6853 | 94.53 | 1302 | 96.44 |

## 2 වන පරිච්ඡේදය

### 2.1 අනුගමනය කරන ක්‍රමවේදය

මෙම ආදර්ශ නිර්මාණය කිරීමට පෙර, දේශගුණික සාධක, පස් වර්ග, වර්ෂාපතන රටා, වර්තමාන වගා ක්‍රම, ආදායම් මට්ටම් සහ කෘෂිකර්මය තුළ ජෛව විවිධත්වයට ඇති තර්ජන යන මේවා, පළාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුවෙහි කාර්ය මණ්ඩල දෙකක් සමග විවේචනාත්මකව සළකා බලා ඇගයීමට ලක් කරන ලදී. වැඩමුළු වලදී අවධාරණය කෙරුණේ, ක්ෂේත්‍රයෙහි අත්හදා බැලීමට යන ඕනෑම ආදර්ශයක් ආර්ථිකමය ශක්‍යතාවෙන් යුතු, සමාජීයයව පිළිගන්නා සහ ගොවීන්ට වැඩි කරදරයකින් තොරව සිදුකළ හැකි විය යුතු බවයි.

### 2.2 ආදර්ශ සංවර්ධන ක්‍රියාවලිය

#### 2.2.1 - ප්‍රතිලාභීන් තෝරාගැනීම

ප්‍රතිලාභීන් තෝරාගැනීම පහත සඳහන් නිර්ණායක භාවිතා කර කළ යුතු බවට යෝජනා කෙරේ.

1. ප්‍රතිලාභියා තමාට හිමිකම ඇති භූමියේ ආදර්ශය පිහිටුවිය යුතුය.
2. කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ මාර්ගෝපදේශවලට අනුගත විය යුතුය.
3. ආදර්ශයෙහි දක්වා ඇති පරිදි අවශ්‍ය වාර්තා පවත්වා ගත යුතුය.
4. පළමු කන්නයෙන් පසු අවශ්‍ය වුවහොත් සමහර වැඩිදියුණු කිරීම් සහිතව තවත් කන්න තුනක් සඳහා එම ආදර්ශයම පවත්වා ගෙන යාමට එකඟ විය යුතුය.
5. වැන්දඹුවන්, ආබාධිතතා සහිත පුද්ගලයින් සහ දුප්පතුන්ගෙනුත් දුප්පතුන් තෝරා ගැනීමට සෑම උත්සාහයක්ම දැරිය යුතු අතර, දක්වා ඇති ක්‍රියාකාරිත්වයන් කාර්යක්ෂමව කරගෙන යාමට ඔවුන්ට හැකි විය යුතුය.

### 2.2.2 සළකා බලන ලද සාමාන්‍ය නීතිරීති

ආදර්ශ නිර්මාණය කිරීමේ ක්‍රියාවලියේදී පහත සඳහන් සාමාන්‍යයෙන් පිළිගත් නීතිරීති සැළකිල්ලට ගන්නා ලදී.

(අ) බහුවිධ බෝග, වාර්ෂික සහ බහු වාර්ෂික බෝග, බෝග සත්ව සංයෝජන
(ආ) බහු භාවිතයන් - සමහර ඒවා සෙවන සඳහා පමණක් වන අතර කොළ පොහොර, බාදනය පාලනය කිරීම, ඖෂධීය ශාක, ආදිය සඳහා වේ.
(ඇ) පාංශු ස්ථායිකාරක, ක්ෂුද්‍රජීවී සංවර්ධනයන්,
(ඈ) යාන්ත්‍රික සංරක්ෂණ ක්‍රමවේද,
(ඉ) ඕනෑම දෙයක් සඳහා කෘතිම සහ හානිකර රසායනික ද්‍රව්‍යවල අවම භාවිතය
(ඊ) ඒකාබද්ධ පළිබෝධ කළමනාකරණය, ඒකාබද්ධ කළමනාකරණය
(උ) වනාන්තර වල ඇති ගස්, දේශීය ශාක
(ඌ) ප්‍රධාන පද්ධති තුළ පවතින සියළු වර්ගවල පරිසර පද්ධති, පොකුණු, විශාල ගස්, පළතුරු ශාක, කුරුල්ලන්, උරගයින්, ආදිය
(එ) පිළිස්සීම අවම වීම.

### 2.2.3 දළ ආන්තිකයන් මත පදනම් වූ මූල්‍ය දර්ශක

මෙම සියළුම ආදර්ශ සංවර්ධනය කිරීමේදී සෘතුමය සහ බහු වාර්ෂික බෝග සහ සත්ව පාලන ක්‍රියාකාරකම් ඇතුළත් කරන ලදී. එබැවින්, එවැනි වාතාවරණයන්හිදී යෝජිත ආදර්ශවල මූල්‍ය තිරසාරභාවය නිර්ණය කිරීමට බහු-වාර්ෂික ප්‍රතිලාභ පිරිවැය තක්සේරුව වඩාත් යෝග්‍ය විය හැක. කෙසේවෙතත්, කාලය පිළිබඳ බාධක සහ ගොවි ප්‍රජාව විසින් තේරුම් ගත යුතු තක්සේරුවෙහි සරලභාවය නිසා, වාර්ෂික දළ ආන්තිකයන් මත පදනම් වූ මූල්‍ය දර්ශක පමණක් භාවිතා කර ඇත. එය මූල්‍ය තිරසාර භාවය සහතික කරනු ඇතැයි උපකල්පනය කර ඇත. එම මූල්‍ය දර්ශක පහසුවෙන් තේරුම් ගත හැකි මෙන්ම, ගොවීන් විසින් එවැනි ආදර්ශ පිළිපැදීම තේරුම් ගැනීමට වාර්ෂික ලාභදායිත්වය වඩාත් යෝග්‍ය වේ.

# 3 වන පරිච්ඡේදය

1 වන ආදර්ශය

**ජෛව විවිධත්වය සංරක්ෂණය කිරීමට ගෙවතු වගා සංවර්ධනය (අක්කර 0.5)**

### 3.1 ආදර්ශයේ යෝජිත ප්‍රමාණය - අක්කර 0.5

වර්තමානයේ ගෙවතු වගා සිදුකරනුයේ ඉහත සඳහන් සාමාන්‍ය නීතිරීති වලට වැඩි අවධානයක් යොමු නොකරය. මෙම නව යෝජිත ආදර්ශය සාමාන්‍ය නීතිරීති යටතේ සඳහන් කරන ලද බොහෝ කාරණාවලින් යුක්ත වන අතර, එය ජෛව විවිධත්වය මෙන්ම පෝෂණය සහ ආහාර සුරක්ෂිතතාව වැඩිදියුණු කිරීමට හැකියාව ලබාදෙයි.

### 3.2 ශ්‍රම අවශ්‍යතාවය

මෙම ආදර්ශය නිර්මාණය වී ඇත්තේ පවුලේ ශ්‍රමයෙන් ක්‍රියා කිරීමට බැවින්, නිර්දේශිත ප්‍රමාණය අක්කර 0.5 කි.

### 3.3 - බෝග සංයෝජන, පරතරය, ප්‍රභේද සහ ශාක සංඛ්‍යාව

ඩිජිටල් නිර්මාණයෙහි පෙන්වා ඇත. මෙම ආදර්ශයෙහි ප්‍රධාන අරමුණ වන්නේ, ජෛව විවිධත්වය සංරක්ෂණය සඳහා වර්තමාන ගෙවතු සංකල්පය වැඩිදියුණු කරන අතර, අමතර ආදායම සහ ආහාර සුරක්ෂිතතාව සහතික කිරීමය. ආදර්ශය සකස් කර ඇත්තේ ගෙවත්තෙන් උපරිම ප්‍රයෝජනය ගැනීමටය. ආදර්ශය ස්ථාපිත කිරීමේ ආසන්න පිරිවැය රුපියල් 247,790 කි.

### 3.4 ආදර්ශයේ විවිධ අංශ සහ ක්ෂේත්‍ර සැළැස්ම

- ජෛව වැට
- පස සහ ජලය සංරක්ෂණය
- බහුවිධ ප්‍රභේද වල පළතුරු වගාව
    - වාණිජ උද්‍යාන වගාව
    - ඌන උපයෝජන පළතුරු වගාව
- ඖෂධීය පැළෑටි වගාව
- කෘෂි වනාන්තර
- ගෙවතු මට්ටමේ එළවළු වගාව
- සත්ව පාලනය
- කොම්පෝස්ට්, කාබනික පොහොර සහ පළිබෝධ නාශක නිෂ්පාදනය



## පාංශු සංරක්ෂණය සහ වැසි ජලය රැස්කරන පොකුණු




## වාණිජ උද්‍යාන වගාවෙහි සැළැස්ම - බහුවාර්ෂික, පුළුල් සහ මධ්‍යම වියන (අඹ, පැණි දොඩම්, පේර)




බහු වාර්ෂික බෝග වගාව සඳහා අවම දුර

- අඹ - මී.10 x මී.10
- පැණිදොඩම් - මී.10 x මී.10
- පේර - මී.10 x මී.10
- අඹ - පැණිදොඩම් - පේර - එකිනෙක අතර දුර මී. 5 යි.

## එළවළු වගාව




## එළවළු තෝරා ගැනීම

<u>රනිල කුලයේ බෝග</u>

- අවර
- දඹල
- මෑ කරල්

<u>සොලනේසියේ බෝග</u>

- මිරිස්
- කොච්චි
- මාළු මිරිස්
- වම්බටු
- එළබටු
- තිබ්බටු
- තක්කාලි

<u>කැකිරි කුලයේ බෝග</u>

- කරවිල
- ලූණා (නියන් වැටකොළු)
- පතෝල
- වට්ටක්කා
- පිපිඤ්ඤා
- පැණි කොමඩු
- තුඹ කරවිල
- කැකිරි
- අළු පුහුල්
- ලබු

<u>අල වර්ග</u>

- බතල
- මඤ්ඤොක්කා
- රාජ අල
- කිරි අල
- හුලං කීරිය අල
- ඉන්නල
- කොහිල

<u>කොළ බෝග</u>

- ගොටුකොළ
- මුකුණුවැන්න
- කන්කුන්
- තම්පලා
- සාරණ
- කූර කොළ
- කිරි අඟුණ.

## ඒකාබද්ධ ගොවිපල ශිල්පීය ක්‍රම




- සත්ව පාලන ඒකකය (ගවමඩුව වළදෙනුන් දෙදෙනෙක් සමග)
- කොම්පෝස්ට් සෑදීමේ ඒකකය
- මී මැසි පාලනය (මී මැසි පෙට්ටි 2 ක්)
- ජෛව ද්‍රව පොහොර සහ පළිබෝධනාශක සෑදීමේ ඒකකය.

## පළතුරු ශාක වගාවේ සැළැස්ම - *බහුවාර්ෂික විවිධ වාසභූමි*



**<u>ඌන උපයෝජන පළතුරු</u>**

- බෙලි
- නෙල්ලි
- සැපතිල්ලා
- ඇඹරැල්ලා
- උගුරැස්ස
- මැටි අනෝදා
- වෙරළු
- මොර
- කාමරංගා
- කටු අනෝදා
- කොස්

**<u>ඖෂධීය ශාක</u>**

- කරපිංචා
- සේර
- රම්පේ
- උක්
- ඉඟුරු
- කහ
- කෝමාරිකා
- සඳුන්

**<u>වන ශාක</u>**

- කොහොඹ
- බුරුත
- ඇහැල

**යහපත් කෘෂිකාර්මික භාවිතයන් (GAP), ඒකාබද්ධ කළ ශාක පෝෂණ පද්ධති (IPNS) සහ ඒකාබද්ධ පළිබෝධ කළමනාකරණය (IPM) ඒකාබද්ධ කිරීම**



## 3.5 මෙම නිර්මාණය සඳහා සැළකිල්ලට ගත් උපකල්පන සහ සාධක

- **කෙසෙල් –**තෝරාගත් වර්ගය වනුයේ *කෝලිකුට්ටු ය.* එයට ඉහළ වෙළඳපොල ඉල්ලුමක් ඇති අතර, වැඩි මිළක් ද ගෙන එයි.
  සෑම පඳුරක්ම පැළ තුනක් සමග පවත්වා ගත යුතු අතර, වසරකට කැන් තුනක් අපේක්ෂා කෙරේ. කෙසෙල් මගින් කිරි අල, ඉඟුරු සහ කහ වැනි වෙනත් වගාවලට සෙවන ලබාදෙයි.

- **පැපොල් –**ආදායම නොනවත්වා ලබාගැනීමට වාර්ෂිකව නැවත පැළ සිටුවීම කළ යුතුය.

- **වැල් දොඩම් –** වසර සතරකට වරක් නැවත පැළ සිටුවීම කළ යුතුය. වැල් ජෛව වැටෙහි ඉහළට යාමට ඉඩ හැරිය හැක.

- **මිශ්‍ර එළවළු - ගෙවත්ත –** මෙයින් පවුලේ එළවළු අවශ්‍යතා බොහොමයක් ලබාදීම අපේක්ෂා කෙරේ. ගොවීන්ගේ වෙළඳපොලෙහි අතිරික්තය අලෙවි කළ හැක. මෙය පවුලේ ආදායම වැඩි කර ගැනීමට සහ අවශ්‍ය කරන පෝෂණය ලබා ගැනීමට සහාය දෙයි. ගෙවත්තෙහි අමතර ප්‍රතිලාභය වන්නේ පවුලෙහි එකමුතුකමට අනුබල දීම සහ මානසික තෘප්තිය ලබා දීමයි.

- **කිරි නිෂ්පාදන අංශය –** සෑම වසරකම වසු පැටියෙක් ලබාගැනීමට අපේක්ෂා කෙරේ. කිරි පරිභෝජනය පවුලේ පෝෂණය වැඩි දියුණු කරන අතර, වැඩිපුර කිරි අලෙවි කළ හැක. පැටවුන් විකිණීමෙන් අමතර ආදායමක් ලබාගත හැකි අතර, කොම්පෝස්ට් සෑදීම සඳහා ගොම භාවිතා කළ හැක.

- සියළුම බහුවාර්ෂික පළතුරු ශාක සෙවන දීම වැළැක්වීම සඳහා හොඳින් කප්පාදු කළ යුතුය.

- සියළුම බහුවාර්ෂික පළතුරු ශාක හොඳින් කප්පාදු කර නිසි පරිදි පවත්වා ගත යුතුය.

## 3.6 ආදර්ශය සඳහා ඇස්තමේන්තුව

| අංකය | බෝගය | ඒකකය | ඒකක සංඛ්‍යාව | ඒකකයක මිල (රු.) | මුළු පිරිවැය (රු.) |
|---|---|---|---|---|---|
| 1 | අඹ Tom EJC | පැළ | 10 | 250 | 2,500.00 |
| 2 | අඹ කර්තකොලොම්බන් | පැළ | 10 | 250 | 2,500.00 |
| 3 | බිබිලේ දොඩම් | පැළ | 30 | 250 | 7,500.00 |
| 4 | පේර බැංකොක් යෝධ | පැළ | 5 | 200 | 1,000.00 |
| 5 | දෙහි | පැළ | 20 | 100 | 2,000.00 |
| 6 | දෙළුම් | පැළ | 10 | 70 | 700.00 |
| 7 | බද්ධ කළ බෙලි | පැළ | 2 | 200 | 400.00 |
| 8 | බද්ධ කළ සැපදිල්ලා | පැළ | 2 | 200 | 400.00 |
| 9 | ඇඹරැල්ලා | පැළ | 2 | 200 | 400.00 |
| 10 | බද්ධ කළ උගුරැස්ස | පැළ | 2 | 250 | 500.00 |
| 11 | නෙල්ලි | පැළ | 2 | 70 | 140.00 |
| 12 | බද්ධ කළ මොර | පැළ | 2 | 200 | 400.00 |
| 13 | මැටි අනෝදා | පැළ | 5 | 70 | 350.00 |
| 14 | කටු අනෝදා | පැළ | 5 | 70 | 350.00 |
| 15 | කෙසෙල් කෝලිකුට්ටු | පැළ | 50 | 150 | 7,500.00 |
| 16 | පැපොල් දෙමුහුම් | පැළ | 20 | 50 | 1,000.00 |
| 17 | වැල් දොඩම් | පැළ | 20 | 50 | 1,000.00 |
| 18 | බද්ධ කළ කොස් | පැළ | 2 | 200 | 400.00 |
| 19 | එළවළු* | ව.මී. 1 | 500 | 10 | 5,000.00 |
| 20 | තිබ්බටු | පැළ | 30 | 40 | 1,200.00 |
| 21 | මිශ්‍ර එළවළු | ව.මී. 1 | 1 | 50 | 50.00 |
| 22 | කිරි අල | පැළ | 150 | 20 | 3,000.00 |
| 23 | මී පැණි පෙට්ටියකට | මී වද | 2 | 1500 | 3,000.00 |
| 24 | කිරි නිෂ්පාදන ඒකක - කිරි - එක් එළදෙනක් | ඒකක | 1 | 50000 | 50,000.00 |
| 25 | මුරුංගා | පැළ | 30 | 10 | 300.00 |
| 26 | පොල් | පැළ | 3 | 200 | 600.00 |
| 27 | තුඹ කරවිල | පැළ | 50 | 50 | 2,500.00 |
| 28 | ජෛව වැට | මීටර් | 180 | 100 | 18,000.00 |
| 29 | වැසි ජලය එකතු කිරීමේ ටැංකිය (ඝ.මී. 200) | ඒකක | 1 | 50000 | 50,000.00 |
| 30 | පාංශු සංරක්ෂණ බැමි (මී.) | මීටර් | 150 | 100 | 15,000.00 |
| 31 | ප්ලාස්ටික් ටැංකි (ලී. 1000) | ඒකක | 1 | 15000 | 15,000.00 |
| 32 | ඇල්කතීන් බට (අඟල් 0.5) මී. | මීටර් | 200 | 30 | 6,000.00 |
| 33 | වෑස්සුම් (සීරු මාරු කළ හැකි) | සංඛ්‍යාව | 100 | 20 | 2,000.00 |
| 34 | කාබනික දියර පොහොර සඳහා බැරලය | සංඛ්‍යාව | 2 | 2000 | 4,000.00 |
| 35 | රිජිෆෝම් පෙට්ටි (අඟල් 18 x අඟල් 24) | සංඛ්‍යාව | 10 | 500 | 5,000.00 |
| 36 | අඟල් 4 ප්ලාස්ටික් ඩිප් කෝප්ප | සංඛ්‍යාව | 60 | 25 | 1,500.00 |
| 37 | ඇල්බට් ද්‍රාවණ මිශ්‍රණය | කි.ග්‍රෑ. | 2 | 500 | 1,000.00 |
| 38 | කම්කරු ගාස්තු | මිනිස් දින | 20 | 1500 | 30,000.00 |
| | **මුළු පිරිවැය** | | | | **242,190.00** |

### 3.7 ලබාගත හැකි ආදායම

| | බෝගය | වසර 3ක් සඳහා | වසර 5 ක් සඳහා | වසර 7 ක් සඳහා | වසර 10 ක් සඳහා |
|---|---|---|---|---|---|
| 1 | අඹ (Tom EJC) | 5,000 | 69,375 | 206,875 | 431,875 |
| 2 | අඹ (කර්ත කොලොම්බන්) | 0 | 7,500 | 59,250 | 160,500 |
| 3 | දොඩම් (බිබිලේ පැණි දොඩම්) | 0 | 19,500 | 72,000 | 162,000 |
| 4 | පේර (බැංකොක් යෝධ) | 52,500 | 214,500 | 394,500 | 664,500 |
| 5 | දෙහි | 0 | 14,000 | 74,000 | 164,000 |
| 6 | දෙළුම් | 1,000 | 16,250 | 34,250 | 61,250 |
| 7 | ඇඹරැල්ලා | 0 | 0 | 720 | 4,470 |
| 8 | ඌන උපයෝජන පළතුරු | 0 | 2,000 | 6,000 | 12,000 |
| 9 | කටු අනෝදා | 1,700 | 3,700 | 5,700 | 8,700 |
| 10 | කෙසෙල් කෝලිකුට්ටු | 240,000 | 540,000 | 840,000 | 1,290,000 |
| 11 | පැපොල් දෙමුහුම් | 75,000 | 153,750 | 232,500 | 350,625 |
| 12 | වැල් දොඩම් | 8,000 | 15,500 | 23,000 | 34,250 |
| 13 | තිඹිබටු | 34,000 | 66,000 | 98,000 | 146,000 |
| 14 | මිශ්‍ර එළවළු (ගෙවත්ත) | 180,000 | 300,000 | 420,000 | 600,000 |
| 15 | කිරි අල | 22,500 | 37,500 | 52,500 | 75,000 |
| 16 | මී පැණි පෙට්ටියකට | 12,000 | 21,600 | 31,200 | 45,600 |
| 17 | කිරි නිෂ්පාදන ඒකකය - කිරි - එක් එළදෙනක් | 56,700 | 170,100 | 283,500 | 397,275 |
| 18 | අන්නාසි | 12,500 | 22,500 | 32,500 | 42,600 |
| 19 | මුරුංගා | 18,000 | 42,000 | 66,000 | 102,000 |
| 20 | පොල් | 0 | 0 | 12,000 | 48,000 |
| 21 | එළබටු | 600 | 1,000 | 1,000 | 1,000 |
| 22 | තුඹ කරවිල | 15,000 | 25,000 | 35,000 | 50,000 |
| 23 | කරපිංචා | 1,500 | 2,500 | 3,500 | 5,000 |
| 24 | වට්ටක්කා | 6,000 | 10,000 | 14,000 | 20,000 |
| 25 | කැකිරි | 1,350 | 2,250 | 3,150 | 7,050 |
| 26 | අළු පුහුල් | 600 | 1,800 | 2,200 | 2,800 |
| 27 | පිපිඤ්ඤා | 900 | 1,500 | 2,100 | 3,000 |
| 28 | පැණි කොමඩු | 900 | 1,500 | 2,100 | 3,000 |
| 29 | ග්ලිරිසීඩියා | 3,600 | 6,800 | 10,000 | 14,800 |
| 30 | පාවට්ටා (මීටරයට) | 19,800 | 41,400 | 63,000 | 95,400 |
| | එකතුව - රු. | 769,150 | 1,809,525 | 3,080,545 | 5,002,695 |

### 3.8 දළ ආන්තිකයන් මත පදනම් වූ මූල්‍යමය නිර්ණායක - වසර 10 කට

| 1 වන ආදර්ශය | වසර 1 | වසර 2 | වසර 3 | වසර 4 | වසර 5 | වසර 6 | වසර 7 | වසර 8 | වසර 9 | වසර 10 |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| ආදායම | 82,600 | 248,375 | 405,025 | 475,075 | 533,200 | 595,745 | 643,975 | 583,400 | 644,625 | 644,625 |
| පිරිවැය | 392,790 | 180,000 | 180,000 | 180,000 | 180,000 | 180,000 | 180,000 | 180,000 | 180,000 | 180,000 |
| ලාභය | **-310,190** | **68,375** | **225,025** | **295,075** | **353,200** | **415,745** | **463,975** | **403,400** | **464,625** | **464,625** |
| | | | | | | | | | | |
| ආදායම/පිරිවැය අනුපාතය | 0.21 | 1.38 | 2.25 | 2.64 | 2.96 | 3.31 | 3.58 | 3.24 | 3.58 | 3.58 |
| ආදායම/පිරිවැය % | 21.03 | 137.99 | 225.01 | 263.93 | 296.22 | 330.97 | 357.76 | 324.11 | 358.13 | 358.13 |
| | | | | | | | | | | |
| ලාභය/පිරිවැය අනුපාතය | -0.79 | 0.38 | 1.25 | 1.64 | 1.96 | 2.31 | 2.58 | 2.24 | 2.58 | 2.58 |
| ලාභය/පිරිවැය % | -78.97 | 37.99 | 125.01 | 163.93 | 196.22 | 230.97 | 257.76 | 224.11 | 258.13 | 258.13 |

| | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| **සමුච්චිත ආදායම** | 82,600 | 330,975 | 736,000 | 1,211,075 | 1,744,275 | 2,340,020 | 2,983,995 | 3,567,395 | 4,212,020 | 4,856,645 |
| සමුච්චිත පිරිවැය | 392,790 | 572,790 | 752,790 | 932,790 | 1,112,790 | 1,292,790 | 1,472,790 | 1,652,790 | 1,832,790 | 2,012,790 |
| සමුච්චිත ලාභය | -310,190 | -241,815 | -16,790 | 278,285 | 631,485 | 1,047,230 | 1,511,205 | 1,914,605 | 2,379,230 | 2,843,855 |

| | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| ආදායම/පිරිවැය අනුපාතය | 0.21 | 0.58 | 0.98 | 1.30 | 1.57 | 1.81 | 2.03 | 2.16 | 2.30 | 2.41 |
| ආදායම/පිරිවැය % | 21.03 | 57.78 | 97.77 | 129.83 | 156.75 | 181.01 | 202.61 | 215.84 | 229.81 | 241.29 |
| | | | | | | | | | | |
| ලාභය/පිරිවැය අනුපාතය | -0.79 | -0.42 | -0.02 | 0.30 | 0.57 | 0.81 | 1.03 | 1.16 | 1.30 | 1.41 |
| ලාභය/පිරිවැය % | -78.97 | -42.22 | -2.23 | 29.83 | 56.75 | 81.01 | 102.61 | 115.84 | 129.81 | 141.29 |

**දෙවැනි ආදර්ශය**

වැඩිදියුණු කළ ජෛව විවිධත්ව සංරක්ෂණය සහ යහපත් කෘෂිකාර්මික භාවිතයන් සමග අඹ වගා කිරීම (අක්කර 1)

**3.2.1 ආදර්ශයේ යෝජිත ප්‍රමාණය - අක්කර** 1

වර්තමානයේදී අඹ වගාව සිදුකරන්නේ බොහෝවිට තනි බෝගයක් ලෙස වුවත්, වඩා පුළුල් පරතරයක් තැබීමෙන් අන්තර් බෝග වගා කිරීමට උපකාරී වනු ඇත. යහපත් කෘෂිකාර්මික භාවිතයන් ප්‍රයෝජනයට ගෙන ප්‍රධාන බෝගය ලෙස අඹ නිෂ්පාදනය කෙරෙනු ඇත. මෙම නිෂ්පාදනය ගොවීන්ගේ වෙළඳපොලට සම්බන්ධ කිරීමට බලාපොරොත්තු වේ.

**3.2.2 ශ්‍රම අවශ්‍යතාවය - පවුලේ සහ කුලියට ගත් ශ්‍රමය.**

**3.2.3 බෝග සංයෝජනය, පරතරය තැබීම, ප්‍රභේද සහ පැළ සංඛ්‍යාව**

ඩිජිටල් නිර්මාණයෙහි පෙන්වා ඇත. මෙම ආදර්ශයේ ප්‍රධාන අරමුණ වනුයේ අමතර ආදායමක් සහ ආහාර සුරක්ෂිතතාව සහතික කරන අතර, ජෛව විවිධත්වය සංරක්ෂණය සඳහා පවතින අඹ වගාවන් වැඩිදියුණු කිරීමය. ආදර්ශය සකස් කර ඇත්තේ භූමියෙහි උපරිම ප්‍රයෝජනය ගෙන වෙනත් බෝග කිහිපයක්ද ඇතුළත් කිරීමටය.

**3.2.4 ආදර්ශයේ විවිධ අංග සහ ක්ෂේත්‍ර සැළැස්ම**

- ජෛව වැට
- පාංශු සහ ජල සංරක්ෂණය
- **වාණිජ උද්‍යාන වගාව (අඹ)**
- විවිධ ප්‍රභේදවල වෙනත් පළතුරු වගාව
- විවිධ ප්‍රභේදවල එළවළු වගාව
- ඖෂධීය පැලෑටි වගාව
- මී මැසි පාලනය
- කොම්පෝස්ට්, කාබනික පොහොර සහ පළිබෝධ නාශක නිෂ්පාදනය
- අඹ ප්‍රධාන වාණිජ වගාව වේ.
    - ප්‍රභේද - කර්තකොලොම්බන් හෝ TEJC.
    - පැළවලට සහ භූමියෙහි අනෙක් කොටස්වලට නිසි පරිදි සූර්යාලෝකය ලැබීම සඳහා පැල සිටුවීමේ පරතරය නැගෙනහිර - බටහිර රේඛාව ඔස්සේ මී. 10 x මී. 5 වේ.

## ජෛව වැටෙහි සැළැස්ම

(ග්ලිරිසීඩියා, කතුරු මුරුංගා, මුරුංගා, ගංසූරිය, පාවට්ටා, වැල් දොඩම්, කිරි අඟුණ, දඹල, අවර, තල්කොල, කෝවක්කා)




## පස සහ වැසි ජලය සංරක්ෂණය සඳහා බැම්



## ප්‍රධාන බෝගය - මී. 10 X මී. 5 අතර අඹ වගාව




## වෙනත් පළතුරු බෝග - බහුවාර්ෂික, මධ්‍යම උඩු වියන (පැණි දොඩම්, පේර සහ දෙහි)




**<u>පරතරය තැබීම</u>**

අඹ – මී. 5 x මී. 10 ප්‍රධාන බෝගය ලෙස

පැණි දොඩම් - මී. 5 x මී. 10 අඹ පේළි අතර

පේර – මී. 5 x මී. 10 අඹ ගස් අතර

දෙහි – ජෛව වැටෙන් මී. 1, පැල අතර මී. 3.

## ඌන උපයෝජන උද්‍යානය - *බහුවාර්ෂික, මධ්‍යම උස, මධ්‍යම උඩු වියන*




# බෝග සංයෝජන

**ප්‍රධාන බෝගය**

- අඹ

**ද්වි වාර්ෂික**

- පැපොල්
- වැල් දොඩම්

**ඖෂධීය පැල**

- කරපිංචා
- සේර
- රම්පෙ
- උක්
- කෝමාරිකා
- සඳුන්

**ජෛව වැට**

- ගංසූරිය
- ග්ලිරිසීඩියා
- මුරුංගා
- පාවට්ටා
- වැල් දොඩම්

**අනෙකුත් ද්වි වාර්ෂික බෝග**

- පැණි දොඩම්
- පේර
- ලෙමන්
- දෙළුම්

**වාර්ෂික**

- පැණි කොමඩු
- කැන්ටලූප්

## එළවළු වගා කිරීම - *වාර්ෂික සහ ද්විවාර්ෂික*




- බැම් දිගේ - සේර, කෝමාරිකා සහ උක්
- වැල් බෝග වලට ව්‍යුහයක් ලෙස බැම් භාවිතය (වට්ටක්කා, කැකිරි, පැණිකොමඩු ආදිය)
- පඳුරු ආකාර ද්වි වාර්ෂිකයින් (එළබටු, වම්බටු) බැම් වල පැති ඔස්සේ.
- අඹ සහ පේර පැල අතර වෙනත් වාර්ෂික එළවළු සහ අල වර්ග
- වැල් වර්ග පවතින ගස් ඔස්සේ නැගීමට ඉඩ සළසයි.

## බෝග සංයෝජන

**රනිල බෝග**
අවර
දඹල
මෑ

**සොළනේසියේ බෝග**
මිරිස්
මාළු මිරිස්
වම්බටු
එළබටු
තිබ්බටු

**කැකිරි කුලයේ බෝග**
කරවිල
නියන් වැට කොළු
පතෝල
වට්ටක්කා
පිපිඤ්ඤා
පැණි කොමඩු
තුඹ කරවිල
බැකිරි
අළුපුහුල්
ලබු

**අල වර්ග**
මඤ්ඤොක්කා
රාජ අල
ඉන්නල
ආර්ටිචෝක් අල
කිරි අල

**කොළ බෝග**
ගොටුකොළ
මුකුණුවැන්න
කන්කුන්
සාරණ
තම්පලා
කූර කොළ
කිරි අඟුණ
තල්කොළ
කෝවක්කා

## ආදර්ශයෙහි ත්‍රිමාන දර්ශනයක්




### 3.2.5 මෙම ආදර්ශය සඳහා සැළකිල්ලට ගත් උපකල්පන සහ සාධක

- **අඹ** ප්‍රධාන බෝගය වන අතර, නිසි පරිදි කප්පාදු කිරීම සහ පුහුණු කිරීම සමග නඩත්තු කළ යුතුය.
- **දොඩම් සහ පේර** අඹ පැල අතර යටිබෝග ලෙස වගා කෙරේ.
- **වැල් දොඩම් –** වසර සතරකට වරක් නැවත සිටුවීම කළ යුතුය. වැල් ජෛව වැට දිගේ නැගීමට ඉඩහරිනු ඇත.
- **මිශ්‍ර එළවළු (ගෙවත්ත)** – පවුලේ දෛනික එළවළු අවශ්‍යතා සපයා දේ. වැඩිපුර එළවළු ගොවීන්ගේ වෙළඳපොල හරහා විකිණිය හැක. මෙය පවුලේ පෝෂණය සහ නිරෝගී ජීවන රටාව වැඩි දියුණු කරයි.

**3.2.6** 2 වැනි ආදර්ශය සඳහා ඇස්තමේන්තුව

| | | | | | |
|---|---|---|---|---|---|
| අංකය | බෝගය | **ඒකකය** | **ඒකක සංඛ්‍යාව** | **ඒකකයක මිළ** | **මුළු පිරිවැය (රු.)** |
| 1 | අඹ (Tom EJC) | පැල | 80 | 250 | 20,000.00 |
| 2 | පැණි දොඩම් (බිබිලේ) | පැල | 80 | 250 | 20,000.00 |
| 3 | පේර (බැංකොක් යෝධ) | පැල | 80 | 200 | 16,000.00 |
| 4 | දෙහි | පැල | 80 | 100 | 8,000.00 |
| 5 | දෙළුම් | පැල | 10 | 70 | 700.00 |
| 6 | බද්ධ කළ බෙලි | පැල | 2 | 200 | 400.00 |
| 7 | සැපදිල්ලා | පැල | 2 | 200 | 400.00 |
| 8 | ඇඹරැල්ලා | පැල | 2 | 200 | 400.00 |
| 9 | බද්ධ කළ උගුරැස්ස | පැල | 2 | 250 | 500.00 |
| 10 | නෙල්ලි | පැල | 2 | 70 | 140.00 |
| 11 | බද්ධ කළ මොර | පැල | 2 | 200 | 400.00 |
| 12 | මැටි අනෝදා | පැල | 2 | 70 | 140.00 |
| 13 | කටු අනෝදා | පැල | 10 | 70 | 700.00 |
| 14 | වැල් දොඩම් | පැල | 20 | 50 | 1,000.00 |
| 15 | තිබ්බටු | පැල | 20 | 40 | 800.00 |
| 16 | මිශ්‍ර එළවළු | ව.මී. 1 | 1 | 50 | 50.00 |
| 17 | කිරි අල | පැල | 20 | 20 | 400.00 |
| 18 | මී පැණි පෙට්ටියකට | මී වද | 3 | 1500 | 4,500.00 |
| 19 | අන්නාසි | පැල | 50 | 20 | 1,000.00 |
| 20 | මුරුංගා | පැල | 60 | 10 | 600.00 |
| 21 | තුඹ කරවිල | පැල | 50 | 50 | 2,500.00 |
| 22 | පජෙව වැට | මී. | 240 | 100 | 24,000.00 |
| 23 | පාංශු සංරක්ෂණ බැමි (මී.) | මී. | 180 | 100 | 18,000.00 |
| 24 | ප්ලාස්ටික් ටැංකි (ලී. 1000) | ඒකක | 2 | 15000 | 30,000.00 |
| 25 | ඇල්කතීන් බට (අඟල් 0.5) මී. | මී. | 600 | 30 | 18,000.00 |
| 26 | වැස්සුම් (සීරු මාරු කළ හැකි) | සංඛ්‍යාව | 160 | 30 | 4,800.00 |
| 27 | කාබනික දියර පොහොර සඳහා බැරලය (ලී. 200) | සංඛ්‍යාව | 2 | 2000 | 4,000.00 |
| | මුළු එකතුව (රු.) | | | | **177,430.00** |

### 3.2.7 ලබාගත හැකි ආදායම

| | | වසර 3 ක් සඳහා | වසර 5 ක් සඳහා | වසර 7 ක් සඳහා | වසර 10 ක් සඳහා |
|---|---|---|---|---|---|
| 1 | අඹ (Tom EJC) | **80,000** | **1,110,000** | **3,310,000** | **6,910,000** |
| 2 | පැණි දොඩම් (බිබිලේ) | **0** | **52,000** | **192,000** | **432,000** |
| 3 | පේර (බැංකොක් යෝධ) | **140,000** | **572,000** | **1,052,000** | **1,772,000** |
| 4 | දෙහි | **0** | **56,000** | **296,000** | **656,000** |
| 5 | දෙළුම් | **1,000** | **16,250** | **34,250** | **61,250** |
| 6 | ඇඹරැල්ලා | **0** | **0** | **720** | **4,470** |
| 7 | ඌන උපයෝජන පළතුරු | **0** | **2,000** | **6,000** | **12,000** |
| 8 | කටු අනෝදා | **6,500** | **16,500** | **26,500** | **41,500** |
| 9 | වැල් දොඩම් | **16,000** | **31,000** | **46,000** | **68,500** |
